## මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# ශ්‍රී ලංකා ගුරු සේවයේ වාර්ෂික ස්ථානමාරු - 2023

1. මධ්‍යම පළාත් සභාවට අයත් පාසල්වල සේවය කරන ගුරුභවතුන්ගෙන් 2023 වර්ෂය සඳහා ගුරු සේවයේ ස්ථානමාරු අයදුම්පත් කැඳවනු ලැබේ.

2. සියලුම ඉල්ලුම්පත්‍ර මෙම දැන්වීම පළවීමෙන් පසු,

   I. කලාපය තුළ හා අන්තර් කලාප අයදුම්පත් www.centralprovinceedu.lk වෙබ් අඩවිය හරහා මාර්ගගත ක්‍රමය (online) හරහා 2022 ජූලි මස 30 දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය.

   II. අන්තර් පළාත් හා ජාතික පාසල් අයදුම්පත් ලිඛිතව 2022 ජූලි මස 30 දිනට හෝ ඊට පෙර ලැබෙන්සේ විදුහල්පති මගින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

3. ස්ථානමාරු ලබාගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී,

   I. කලාපය තුළ ස්ථානමාරු හා අන්තර් කලාප ස්ථානමාරු සඳහා www.centralprovinceedu.lk වෙබ් අඩවිය හරහා පමණක් ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය. (ඉල්ලුම්පත් පිරවීමේදී ඔබ කැමති අන්තර්ජාල පහසුකම් ඇති ස්ථානයකින් ඉල්ලුම්පත් online ඉදිරිපත් කළ හැකි අතර, ඒ සඳහා තාක්ෂණික විද්‍යාගාර හා ප්‍රාදේශීය පරිගණක සම්පත් මධ්‍යස්ථාන (CRC) හරහා අන්තර්ජාලය භාවිත කිරීමට පහසුකම් සලස්වා ඇත)

   II. අන්තර් පළාත් හා ජාතික පාසල් සඳහා ඉල්ලුම් කිරීමේදී මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති නව ඉල්ලුම්පත්‍රය පමණක් භාවිත කළ යුතුය. (අදාළ ඉල්ලුම්පත්‍ර මධ්‍යම පළාතේ ළඟම පිහිටි කලාප අධ්‍යාපන කාර්යාලයෙන් ලබාගත හැකිය)

   III. අන්තර් පළාත් සඳහා ඉල්ලුම්පත්‍ර - 05

   IV. පළාත් රාජ්‍ය සේවයෙන් ජාතික පාසල් සේවය සඳහා ඉල්ලුම්පත්‍ර - 05

   V. ජාතික පාසල් සේවයෙන් පළාත් රාජ්‍ය සේවයට ස්ථාන මාරු ඉල්ලුම්පත්‍ර ජාතික පාසල් අධ්‍යක්ෂවරයා විසින් නියම කරන කාලවකවානුවේදී ඒ සඳහා නිකුත් කරන ඉල්ලුම්පත්‍රය මගින් ඉදිරිපත් කළ යුතුය.

   VI. ඉහත III, IV හා V සඳහා මුල් පත්වීම් ලිපියේ හා මුල් පත්වීම් ස්ථිර කිරීමේ ලිපියේ සහතික කළ පිටපත් ඇමිණිය යුතු අතර, දිවුරුම් ප්‍රකාශය සම්පූර්ණ කර තිබිය යුතුය.

4. අසම්පූර්ණ ඉල්ලුම්පත්‍ර හා මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර ඇති ඉල්ලුම්පත්‍රවලට පරිබාහිරව භාවිත කර ඇති ඉල්ලුම්පත්‍ර හා නියමිත දිනෙන් පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරන බව විශේෂයෙන් සැලකිය යුතුය. (A4 ප්‍රමාණයේ පිටු 04 කින් සකස් කර ඇත)

   - අන්තර් කලාප හා කලාපය තුළ ස්ථානමාරු අයදුම්පත් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකිරීම අන්තර්ජාලය හරහා අදාළ කලාප කාර්යාල හා පළාත් අධ්‍යාපන කාර්යාලය මගින් සිදුකෙරේ.

5. චක්‍රලේඛ අංක ඊඩී /1/27/15/1/2007, 2007/20 හා 2007.12.13 දතමින් නිකුත් කර ඇති ජාතික ගුරු මාරු චක්‍රලේඛයට හා මධ්‍යම පළාත් සභාවේ තීරණ වලට අනුව 2023 ගුරු සේවය ස්ථාන මාරු ක්‍රියාත්මක කරනු ලැබේ.

6. මධ්‍යම පළාතේ ගුරු මාරු සිදුකිරීම පහත සඳහන් කොන්දේසිවලට යටත්ව සිදු කෙරේ.

   i. ස්ථානමාරු අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේදී පත්වීම් ලිපියේ සඳහන් කොන්දේසි සම්පූර්ණ විය යුතුය. උදා: (දුෂ්කර සේවා කාලය සම්පූර්ණ කිරීම) දුෂ්කර සේවා කලය තුළදී වුවද පාසල හා කලාපයට අතිරික්තව හෝ අනුප්‍රාප්තිකයෙකු රහිතව නිදහස් කරනු ලැබුවද සේවා අවශ්‍යතාවය මත සහ පත්වීම් කොන්දේසි සපුරාලීමේ අවශ්‍යතාවය මත වෙනත් අධ්‍යාපන කලාපයක පිහිටි දුෂ්කර පාසලකට වුවද ස්ථානගත කළ හැකිය.

   ii. විනය හේතු මත ස්ථාන මාරුකර ඇති ගුරුභවතුන් ස්ථානමාරු සඳහා සුදුසුකම් නොලබනු ඇත.

   iii. අන්තර් පළාත් ස්ථානමාරු සඳහා මධ්‍යම පළාත තුළ අවම වශයෙන් අවුරුදු 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර, පත්වීම ස්ථිර කර තිබිය යුතුය.

7. පාසලට අතිරික්තව සිටින සහ වසර 08 කට වැඩි සේවා කාලයක් එකම පාසලේ සේවය කර ඇති ගුරුභවතුන් ස්ථානමාරු ඉල්ලීම් නොකළද සේවා අවශ්‍යතාවය මත ස්ථානමාරුවීම්වලට යටත් වේ.

8. ස්ථානමාරු අයදුම්පත් අන්තර්ජාලයට ඇතුළත් කළ පසු අයදුම්කරු සඳහා ලියාපදිංචි අංකයක් ලැබේ.

9. අන්තර් පළාත් හා ජාතික පාසල් ස්ථානමාරු අයදුම්පත් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ පසු එම අයදුම්පත්‍ර ලියාපදිංචි කර එම අංකය ඔබ වෙත එවනු ලබන අතර, ඉදිරි විමසීම් වලදී එම ලියාපදිංචි අංකය අදාළ හැම අවස්ථාවකදීම භාවිතා කරන ලෙස කාරුණිකව දන්වමි.

**එම්. ජී. අමරසිරි පියදාස**
**මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ**